# ශ්‍රී ලාංකික ගැමි සමාජ ව්‍යුහයේ ක්‍රියාකාරිත්වය තුළ ගැමියන්ගේ චර්යාවන් කෙරෙහි "නිමිති" සම්බන්ධ ආකල්පයන්ගේ බලපෑම පිළිබඳ අධ්‍යයනයක්

ජේ.ඒ.එන්.ඒ. ජයකොඩි[1]

ගැමි සමාජයෙහි පැවැත්ම සඳහා සාම්ප්‍රදායිකව පැවතුණු අභිචාර වැදගත් විය. සරල ජීවන රටාවකට හුරු වී සිටි පැරණි ගැමියාත් ස්වභාවික පරිසරයත් අතර පැවතියේ, අවියෝජනීය සබඳතාවයකි. ඒ හේතුවෙන්, අභිචාරාත්මක ස්වභාවයක් ගත්, ඔවුන්ගේ ඇදහිලි, විශ්වාසයන් ස්වභාවික පරිසරය සමඟ ගැටුණු අත්දැකීම් හා බද්ධ විය. එවැනි විශ්වාස පද්ධතියක් ලෙස, 'නිමිති' හැඳින්විය හැක. ශ්‍රී ලාංකික ගැමි සමාජ ව්‍යුහය තුළ ගැමියන්ගේ චර්යාව කෙරෙහි නිමිති සම්බන්ධ ආකල්පයන් බලපෑමක් ඇති කර තිබේද? යන්න, පිළිබඳව අවධානය යොමු කරමින් අධ්‍යයනය සිදු කිරීම සඳහා ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තලහේන යන ග්‍රාමීය ප්‍රදේශයෙන් සමස්ත ජනගහනයෙන් 20%ක් නියෝජනය වන පරිදි නිස්සම්භාවී නියැඳියක් යටතේ දත්ත දායකයින් තෝරා ගන්නා ලදී. අර්ධ ව්‍යුහගත සම්මුඛ සාකච්ඡා ක්‍රමය සහ නිරීක්ෂණය යන ශිල්ප ක්‍රම ඔස්සේ රැස් කළ දත්ත ගුණාත්මකව විශ්ලේෂණයට බඳුන් කෙරිණි. ඒ අනුව ශ්‍රී ලාංකික ගැමි සමාජ ව්‍යුහය තුළ ගැමියන්ගේ චර්යාව කෙරෙහි නිමිති සම්බන්ධ ආකල්පයන් බලපෑමක් ඇති කර තිබෙන බව නිගමනය විය. විශේෂයෙන්ම ගැමියන් සිය දෛනික චර්යා රටාවන් ද, මෙම නිමිති සම්බන්ධ ආකල්පයන් නිසා වෙනස් කරගන්නා බව තහවුරු විය. එමෙන්ම ඇතැම් ගැමියන් විවිධ හේතු කාරණා මත ආකල්පමය වශයෙන් නිමිති බැහැර කරන බවක් ප්‍රකාශ කළත්, ප්‍රායෝගික ක්‍රියාකාරිත්වයෙන් තම චර්යා රටාවන් නිමිති නිසා වෙනස් වන බවත් ගම්‍ය විය.

මුඛ්‍ය පද : නිමිති, ගැමි සමාජ, සුභ-අසුභ, ආකල්ප, චර්යා

---

[1]සහකාර කථිකාචාර්ය, සමාජ විද්‍යා අධ්‍යයන අංශය , සමාජීය විද්‍යා පීඨය , කැලණිය විශ්වවිද්‍යාලය